# ඇමරිකන් එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

# ප්‍රවෘත්ති නිවේදනය

මහජන කටයුතු අංශය


දුරකථනය: +94 (11) 249-8100 ෆැක්ස්: +94 (11) 244-9070

විද්‍යුත් තැපෑල: VanHornNT@state.gov http://lk.usembassy.gov



නිවේදන අංක: 20191106


## මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් සංවර්ධන ආධාර ප්‍රදානයේ ඉදිරි පියවර පිළිබඳ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ ප්‍රකාශය

කොළඹ, නොවැම්බර් 6, 2019: ඩොලර් මිලියන 480 ක මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (එම්.සී.සී.) සංවර්ධන ආධාර ප්‍රදානය අනුමත කිරීමට අමාත්‍ය මණ්ඩලය ගත් තීරණය එක්සත් ජනපදය අගය කරයි. රජයේ සහ පෞද්ගලික අංශයේ හඳුනාගත් අවශ්‍යතා සඳහා අරමුදල් සැපයීම තුළින් අවම වශයෙන් ශ්‍රී ලාංකිකයින් මිලියන 11 කට ප්‍රතිලාභ සැලසෙනු ඇතැයි අපේක්ෂාවෙන් ශ්‍රී ලංකාව මෙම සහයෝගය ඉල්ලා සිටියේය. මෙම ප්‍රදානයෙන් සහය වන වැඩසටහන් මගින් රථවාහන තදබදය අවම කිරීම, කොළඹ පොදු ප්‍රවාහන සේවය වැඩිදියුණු කිරීම, පළාත් මාර්ග වැඩිදියුණු කිරීම සහ ඉඩම් පරිපාලනය ක්‍රමවත් කිරීම සහ ශ්‍රී ලාංකිකයන්ගේ ඉඩම් අයිතිවාසිකම් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය දැනට ආරම්භ කොට ඇති කටයුතු පුළුල් කරනු ඇත. ශ්‍රී ලංකා රජය, ප්‍රදාන ගිවිසුමේ කෙටුම්පත මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කර ඇති අතර, එය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ජනතාවට ලබා ගත හැකිය. එම්.සී.සී. ගිවිසුම යටතේ එක්සත් ජනපදයට කිසිදු ඉඩමක අයිතිය හෝ බදු දීමක් සිදු නොවනු ඇත. අවුරුදු 5 ක ප්‍රදාන ආධාර ගිවිසුම ක්‍රියාත්මක කාලය පුරාවටම, අරමුදල් සපයන ව්‍යාපෘති සියල්ල ශ්‍රී ලංකාව විසින් අධීක්ෂණය හා කළමනාකරණය කරනු ඇත.

ජනාධිපතිවරණය ළඟා වෙත්ම, 2019 නොවැම්බර් 16 න් පසු ශ්‍රී ලංකා රජය සමඟ ගිවිසුම අත්සන් කිරීමට සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට එක්සත් ජනපදය අපේක්ෂා කරයි. අනෙකුත් හවුල්කාර රටවල් 29 තුළම ක්‍රියාත්මක වන අපගේ ප්‍රතිපත්තියට අනුව ප්‍රදානය සමාලෝචනය කිරීමට හා අනුමත කිරීමට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට අවස්ථාව ලැබෙනු ඇත. එක්සත් ජනපදය, ශ්‍රී ලංකාව සමඟ ඇති හවුල්කාරිත්වය අඛණ්ඩව

පවත්වාගෙන යාමට සහ ආර්ථික වර්ධනය තුළින් දරිද්‍රතාවය අවම කිරීම සඳහා දරන ප්‍රයත්නයට සහාය වීමට අපේක්ෂා කරයි.